# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

අංක 2249/32 - 2021 ඔක්තෝබර් මස 15 වැනි සිකුරාදා - 2021.10.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්.ඩී.බී.-5/2021.

**2021 අංක 21 දරන ඛනිජතෙල් සම්පත් පනත**

2021 අංක 21 දරන ඛනිජතෙල් සම්පත් පනතේ 5(3)(ආ) සහ 30(3) වන වගන්ති සමග කියවිය යුතු එම පනතේ 48 වන වගන්තිය යටතේ බලශක්ති අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

**උදය ගම්මන්පිල,**
බලශක්ති අමාත්‍ය.

2021 ඔක්තෝබර් මස 14 වැනි දින,
කොළඹ දී ය.


1A - G 35109 - 25 (2021/10)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## නියෝග

1. මෙම නියෝග 2021 අංක 1 දරන ඛනිජතෙල් සම්පත් (පත්කළ සාමාජිකයන්ගේ සහ අධ්‍යක්ෂ-ජනරාල්වරයාගේ අවම සුදුසුකම්) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. පනතේ 5(3)(ආ) වන වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලයේ පත්කළ සාමාජිකයෙකුගේ අවම සුදුසුකම් පහත දැක්වෙන පරිදි විය යුතු ය:-

   (අ) අවම වශයෙන් වසර දොළහක පළපුරුද්ද සහිත ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු වීම;

   (ආ) ඛණිජතෙල් සම්පත් ගවේෂණ ක්‍රමවේද පිළිබඳ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර දොළහක ප්‍රායෝගික පළපුරුද්ද සහිත භූවිද්‍යාඥයෙකු හෝ භූභෞතික විද්‍යාඥයෙකු හෝ භූරසායන විද්‍යාඥයෙකු හෝ පාෂාණ භෞතික විද්‍යාඥයකු වීම;

   (ඇ) අවම වශයෙන් වසර දොළහක ආයතනික පළපුරුද්ද සහිත පිළිගත් ආයෝජන, ව්‍යාපෘති මූල්‍ය, මූල්‍ය කළමනාකරණ හෝ ගණකාධිකාරී, ක්ෂේත්‍රවල වෘත්තිකයකු හෝ වරලත් මූල්‍ය විශ්ලේෂකවරයකු වීම;

   (ඈ) ඛනිජතෙල් කර්මාන්ත ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර දොළහක පළපුරුද්ද සහිත ඉංජිනේරුවරයකු වීම;

   (ඉ) ආයතනික පාලන කටයුතු ක්ෂේත්‍රයේ ආදර්ශවත් අතීත දක්ෂතා සහිත ජ්‍යෙෂ්ඨ ආයතනික නියමුවකු වීම; හෝ

   (ඊ) අවම වශයෙන් වසර දොළහක වෘත්තීය පළපුරුද්ද සහිත ස්වාධීන පර්යේෂණ සහ ප්‍රතිපත්ති පසුබිමක් සහිත ආර්ථික විද්‍යාඥයෙකු වීම.

3. පනතේ 30(1) වන වගන්තිය යටතේ පත් කරන ලද ශ්‍රී ලංකා ඛනිජතෙල් සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ-ජනරාල්වරයාගේ අවම සුදුසුකම් සහ පළපුරුද්ද පහත දැක්වෙන පරිදි විය යුතු ය:-

   (අ) විශේෂයෙන් තෙල් හා වායු ක්ෂේත්‍රයට අදාළ, නමුත් ඛනිජතෙල් භූවිද්‍යාව, ගවේෂණ භූවිද්‍යාව, ඛනිජතෙල් ඉංජිනේරු ශිල්පය, ඛනිජතෙල් ආකර ඉංජිනේරු ශිල්පය, පිපුරුම් හා නිෂ්පාදන ඉංජිනේරු ශිල්පය හෝ ඛනිජතෙල් ආර්ථික විද්‍යාව යන ක්ෂේත්‍රයන්ට සීමා නොවූ පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් භෞතික විද්‍යාව හෝ ඉංජිනේරු ශිල්පය පිළිබඳ උපාධියක් ලබා තිබීම;

   (ආ) අක්වෙරළ මෙහෙයුම් ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර පහක පළපුරුද්දක් ඇතුළුව ඛනිජතෙල් ගවේෂණය, සංවර්ධනය සහ නිෂ්පාදන කටයුතු පිළිබඳ අන්තර්ජාතික සම්බන්ධවීමක් සහිත අවම වශයෙන් වසර පහළොවක පළපුරුද්දක් ලබා තිබීම; සහ

   (ඇ) පරිපාලන සහ ව්‍යාපෘති කළමනාකරණ ක්ෂේත්‍රවල ජ්‍යෙෂ්ඨ මට්ටමේ අවම වශයෙන් වසර තුනක පළපුරුද්ද සහිත වීම.

4. මේ නියෝගවල -

   "පනත" යන්නෙන් 2021 අංක 21 දරන ඛනිජතෙල් සම්පත් පනත අදහස් වේ.

10 - 449

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.